)වීඥද්ඕ ඥදවීලු!දි ටීඦිරිමීවී
All Rights Reserved

**අවසාන වාර පරීක්ෂණය 2015**

8 ශ්‍රේණිය

# සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි.

නම/ විභාග අංකය : ..........................................................................................

- පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

01 දෙවේලේ දකින කුකුළගෙ ..........................................................................................

02 නිවට ඇම්බැට්ටයා දුටුවාම ..........................................................................................

- පහත දැක්වෙන අර්ථය ඇති තනි වචනය ලියන්න.

03 අනුන්ගේ යහපතට වැඩ කිරීමට කැමති ..........................................................................

04 ටික කලකට පමණක් සීමා වූ ..........................................................................

- පහත සඳහන් වාක්‍යවල යටින් ඉරි ඇඳි පදය සඳහා යෝග්‍ය සමානාර්ථ පදය වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.

(වසරට / මසකට / හස්තය / කර)

05 රජතුමාට අයත් වස්තුවලට කිසිවෙක් <u>අත</u> නොතබති. ..................................................................

06 ඇතැම් ගොවියෝ තමන්ට ලැබෙන අස්වැන්නෙන් <u>මුළු අවුරුද්දට ම</u> සෑහෙන ප්‍රමාණයක් වී බිස්සෙහි රඳවා ගනිති. ..................................................................

- පහතින් දී ඇති වචනවලට ඉදිරියෙන් දී ඇති වචනවල ඇති නොගැළපෙන වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

07 පොත  පුස්තකය, පත්‍රය, ග්‍රන්ථය, ගත

08 දුගී  නිර්ධන, දුප්පත්, ධනවත්, දිළිඳු

● පහත සඳහන් වාක්‍යවල ඇති පූර්ව ක්‍රියා පදය තෝරා එය මිශ්‍ර ක්‍රියාවක් බවට පත්කර ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

09 කුරුල්ලෝ කිචි බිචි ගා අත්තෙන් අත්තට පනිති. ..............................................................

10 ශිෂ්‍යයෝ පොත් පත් කියවා දැනුම ලබති. ..............................................................

● පහත දැක්වෙන පාඨවල ඇති උපමා හා උපමේය වෙන්කර දක්වන්න.

11 එදා ජයවර්ධන පුරය සුරපුරක් බඳු විය.

උපමාව ......................................................  උපමේය ..............................................................

12 සෙබළු සිංහයන් මෙන් නිර්භීතව පෙරට ඇදුනාහ.

උපමාව ......................................................  උපමේය ..............................................................

● පහත දැක්වෙන වාක්‍යවල ඇති යටින් ඉරි ඇඳි ඉගි වැකි වලින් ප්‍රකාශ වන අදහස තිත් ඉරි මත ලියන්න.

13 බොහෝ ළමයින් පාසල් යාමට පිටත් වන්නේ <u>කුකුළා අතින් අරගෙනය.</u>

..............................................................................................................................................

14 ඔහු ලවා වැඩක් කරවා ගැනීම <u>ගලෙන් පට්ටා ගන්නවා වගෙයි.</u>

..............................................................................................................................................

● පහතින් ඉදිරිපත් කර ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට යෙදිය යුතු කෘදන්ත පදය වාක්‍ය ඉදිරිපිට වරහන් තුළ ඇති ක්‍රියා පදයෙන් සකස් කර ලියන්න.

15 ගල් ගුහාව තුළ සුවසේ ...................................................... මුව පැටවකු දක්නට ලැබිණ. (නිදයි)

16 දුගියා ................................................................................................ යදිමින් පාරේ යයි. (හිඟයි)

● නිවැරදි අක්ෂර වින්‍යාසය ඇති පදය තෝරන්න.

17 විස්වාසය / විශ්වාසය / විෂ්වාසය / විශ්වාශය

● හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

18 පාසල් නිවාඩුව ලද ...................................................... උණ වෙඩි සෑදීමට උණ ගස් කැපුවෙමු.

(1) අප (2) අපි (3) ඔවුහු (4) ළමයි

19 වෘක්ෂලතා මහ සුළඟින් කඩා ..........................................................

(1) වැටුණි (2) වැටුණාහ (3) වැටුණෝය (4) වැටෙන ලදී

20 නුඹලා පෙරහැර බැලීමට ..................................................................

(1) යන්නෝය. (2) යන ලදහ. (3) ගියෙහි. (4) ගියෙහු.

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය, දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනක් ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 ශ්‍රී ලංකාවේ ශ්‍රී විභූතිය ගැන ලියැවී ඇති පද්‍ය පන්තිය එක්කර සකස් කරන ලද පොත් පිංච ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) මෙම ඇගයීම සම්බන්ධයෙන් ගුරුතුමාගෙන් ලැබුණු උපදෙස් මොනවා ද? (ල. 02)

(2) මෙම පොත් පිංචෙහි ඇතුළත් පද්‍ය පන්ති දෙකක නම් සඳහන් කරන්න. (ල. 04)

(3) එම පද්‍ය පන්ති රචනා කළ කතුවරු දෙදෙනා නම් කරන්න. (ල. 04)

(4) පොත් පිංච සකස් කිරීමේ දී මුහුණ දුන් ගැටළු දෙකක් සඳහන් කරන්න. (ල. 04)

(5) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ වර්ධනය කරගත් කුසලතා දෙකක් දක්වන්න. (ල. 02)

02 පහත සඳහන් කොටස් අතුරින් එකක් තෝරා ගෙන වචන 150 ට නො අඩු රචනයක් ලියන්න.

(1) ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයක අභිමානය කියාපාන ස්ථානයකි දළඳා මැදුර. දළඳා වහන්සේ ලංකාවට වැඩම කිරීමෙන් පසු එය රාජ්‍යත්වය හා සම්බන්ධ වී පැවතුණි. දළඳා මැදුරේ වාර්ෂික ව පැවැත්වෙන ඇසළ පෙරහැර රටට ශාන්තිය උදාකරන බව අපගේ විශ්වාසයයි. ''දළඳා පෙරහැර තුළින් හෙළිවන ජාතියේ උදාරත්වය'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(2) සතුන්ට ආදරය දැක්වීම ශ්‍රී ලාංකිකයන්ට අමුතුවෙන් පුරුදු විය යුතු දෙයක් නොවේ. මිනිසුන් වෙසෙන පරිසරයේ ම මිනිසාට හිතකර වූ තිරිසන් සත්තු ද වාසය කරති. සතුන්ට ආදරය දැක්වීම සෑම ආගමකින්ම ඉගැන්වේ. ''සත්තු අපේ මිතුරෝ ය'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(3) ක්‍රිඩාව නීරෝගී හා ශක්ති සම්පන්න මිනිස් සමාජයක් බිහි කිරීම සඳහා මනා පිටුවහලක් සපයයි. ක්‍රීඩා නගා සිටුවීම සඳහා අප රට ගන්නා ක්‍රියා මාර්ග ප්‍රමාණවත් නොවන බව පෙනේ. ''ක්‍රීඩාව දියුණු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

(4) ශ්‍රී ලංකාව කෘෂිකාර්මික ජීවන රටාව පදනම් කරගත් රටකි. පෙර රජවරු මේ අනුව රාජ්‍ය පාලන කටයුතු කරගෙන ගියහ. වැව් තැනීම එම පාලන ක්‍රමයේ වැදගත් අංගයක් විය. ඒ අනුව රට ස්වයංපෝෂිත වූවා පමණක් නොව සහල් අපනයනය ද ඇතැම් කාලවල සිදුවිය. ''කෘෂි කර්මාන්තයෙන් රට දියුණු කරමු'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න. (ල. 14 යි.)

03 ඔබේ පාසලේ කනිෂ්ඨ අංශයේ පුස්තකාලයට අවශ්‍ය පොත් මිලදී ගැනීමට අදහස් කර ඇත. ඒ සඳහා සුදුසු පොත් හා මිළ ගණන් දන ගැනීම සඳහා පොත් නාමාවලියක් එවන ලෙස ඉල්ලා කුරුණෑගල කොළඹ පාරේ ගුණසේන පොත් ප්‍රකාශකයින් වෙත යවන ලිපිය ලියන්න. ඔබ මාවතගම පැරකුම් විද්‍යාලයේ කනිෂ්ඨ අංශයේ පුස්තකාලාධිපති යයි සිතා මෙම ලිපිය සකස් කරන්න. (ල. 10 යි.)

04 පහත දැක්වෙන පැදි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රන්වන් හිරු එළිය වැටෙයි රන්වන් පාටින් හිරු බැබළෙන්නේ
සීත සුළං පවන් සැළෙයි සීතල මද නල දසත හමන්නේ
කුරුලු නදින් හද පිබිදෙයි කුරුලු නාද හැම තැන පැතිරෙන්නේ
උදෑසනම සුන්දර වෙයි සුන්දර දවසක් විකසිත වන්නේ

(1) මෙම කවි දෙකින්ම පැවසෙන්නේ දවසේ කුමන වේලාවක් පිළිබඳව ද? (ල. 02)

(2) එම වේලාව සුන්දර වීම කෙරෙහි බලපාන සිදුවීම් දෙකක් ලියන්න. (ල. 02)

(3) පහත දැක්වෙන පදවල තේරුම ලියන්න.

මදනල විකසිත (ල. 02)

(4) සැන්දෑව ගැන කවියක් නිර්මාණය කරන්න. (ල. 04)

05 ''තොප දන්නා දෙවි දහම් නැත''

(1) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(2) කාහට ද?

(3) උපුටාගත් පාඩමේ නම කුමක් ද?

(4) මෙය අයත් කතා වස්තුව නම් කරන්න.

(5) එම කතා වස්තුව අයත් ග්‍රන්ථය නම් කරන්න. (2 x 5 = 10)

06 වැටුණත් නැගිටිමු වැටි වැටි නැගිටිමු

නැග නැග යමු දියුණේ .......

(1) ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

(2) මෙම ගීතය රචනා කළේ කවරෙක් ද?

(3) මෙම ගීතය රචනා කිරීමෙහි අරමුණ කුමක් ද?

(4) මෙම ගීතය ඇතුළත් පාඩමෙහි නම සඳහන් කරන්න.

(5) මෙම රචකයාගේ වෙනත් නිර්මාණ දෙකක් නම් කරන්න. (2 x 5 = 10)